**ශීර්ෂය 122 - ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයෙහි අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව |
| 211 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 122 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 2015 ජූලි 30 |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 2015 අගෝස්තු 11 |
| 211 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 2015 අගෝස්තු 11 |

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු රු.මිලියන 3,417.0 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,136.9 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 8.4 ක සිට රු.මිලියන 234.8 ක් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.92 ක සිට සියයට 18.30 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂය** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 122 | 1,283.1 | 1,048.3 | 234.8 | 18.30 |
| 210 | 214.7 | 206.3 | 8.4 | 3.91 |
| 211 | 1,919.2 | 1,882.3 | 36.9 | 1.92 |
| **එකතුව** | **3,417.0** | **3,136.9** | **280.1** | **8.20** |

## 2 .2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය යටතේ ඇති රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 20-03-02-05 දරන ආදායම් සංකේතය යටතේ 2014 වර්ෂයට අදාළව රු.මිලියන 465 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම ආදායම් සංකේතය යටතේ රු.මිලියන 464.14 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 99 ක ප්‍රමාණයකින් ආදායම් රැස්කර තිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම්

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තු 02 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12201 | 6.0 | 5.9 | 3.2 | 3.6 | 22.0 | 14.9 |
| 21001 | 8.5 | 5.4 | 6.0 | 6.7 | 40.0 | 26.9 |
| 21101 | 52.0 | 37.7 | 44.0 | 44.8 | 300.0 | 215.92 |

## 2.4 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 5.97 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 7002/0000/00/0143/0014 | 5.01 |
| ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 7002/0000/00/0246/0014 | 0.03 |
| රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 7002/0000/00/0104/0014 | 0.93 |
| **එකතුව** | | **5.97** |

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 284.74 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 6000/0000/00/0015/0035 | 107.89 |
| ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0092 | 11.68 |
| රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0093 | 164.18 |
| | 6000/0000/00/0002/0004 | 0.99 |
| **එකතුව** | | **284.74** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන

වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 5 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂය 122 - ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 | පවත්වා නොතිබුණි. |
| රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි. |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| අතිරේක ඉන්ධන ලේඛණය | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය | පවත්වා නොතිබුණි |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

**3.2 විගණන සාක්ෂි නොවීම**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ යටිතල පහසුකම් ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත් ලිපිගොනුව ආදී වූ අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශයෙහි නොතිබීම නිසා එකතුව රු.20,273,612 ක ගනුදෙනුවක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

**--------------------------------------**

අමාත්‍යාංශයට ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 04 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගනුදෙනුවල වටිනාකම රු. 62,581,562 ක් විය.

**3.4 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 කට සළසා තිබුණු රු.300,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 17 කට රු.218,677,569 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 ක සිට සියයට 79 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.5 අග්‍රිම ගිණුම්**

**--------------**

2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමක තිබුණු රු.3,448,812 ක ශේෂය අමාත්‍යාංශය විසින් 2015 අප්‍රේල් 30 දින වන විටද පියවා නොතිබුණි.

**3.6 පොදු තැන්පත් ගිණුම**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 215(3) හි විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේදී වැය ගිණුමකට හර කළ එකතුව රු.1,426,529 ක් පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. එම තැන්පත් මුදල 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර හෝ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර හෝ නොතිබුණි.

(ආ) 2006 ඔක්තෝබර් 23 දිනැති අංක බීඩී/356/280/3/එස් දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව විදේශීය ටෙලිනාට්‍ය , චිත්‍රපට හා වෙළඳ දැන්වීම් වෙනුවෙන් අය කරන බදු ආදායම්, භාර අරමුදලක් පිහිටුවන තෙක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ යුතු වුවද, 2014 වර්ෂය සඳහා ආනයනික රූපවාහිනී වැඩසටහන් වෙනුවෙන් අයකර තිබුණු රු.134,297,000 ක මුළු බදු ආදායමින් රු.106,210,093 ක් සමාලෝචිත වර්ෂය අවසානයටත් ආයෝජනය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

### 3.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 12201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.272,208 ක්වූ අතර, එම හිඟහිටි ශේෂයෙන් රු.124,654ක් වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

### 3.8 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

---

#### අභ්‍යන්තර විගණනය

---

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන 12 ක් වෙනුවෙන් විගණන විමසුම් හා තොරතුරු කැඳවීම් 155 ක් නිකුත් කර තිබුණත් ඒ සඳහා ලද පිළිතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.9 වත්කම් කළමනාකරණය**

-----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

අමාත්‍යාංශයේ වාහන 02 ක් වර්ෂයක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී රන්මිහිතැන්න නරඹන්නන් ප්‍රවාහනයට රු.3,134,000 ක් වැයකර යොදවා තිබූ Golf Cart 02 ක් ආදායම් ඉපයීමකින් තොරව රන්මිහිතැන්න උද්‍යානයෙහි හි ගාල්කර තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ii) 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) ලැබිය යුතු ශේෂ**

---------------------

2006 අංක 11 දරන මුදල් පනතේ 7 වගන්තියට අනුකූලව රූපවාහිනී නාලිකා 02 ක් සම්බන්ධයෙන් ආනයනික චිත්‍රපට, ටෙලිනාට්‍ය හා වාණිජ වැඩ සටහන් වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 වන විට අයකළ යුතු රු. 32,099,978 ක බදු ආදායම වර්ෂ 06 කට අධික කාලයක් හිඟව පැවතුණි.

## 3.10 අනුකූල නොවීම්

--------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104(1)(අ) | 1,380,942 | සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ වාහන 04 ට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 177 | - | රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ ප්‍රවේශපත්‍ර අලෙවියෙන් දිනකට රු.100,000 ක සාමාන්‍ය ආදායමක් ලැබුණත් එම මුදල් දින 02 ක සිට දින 05 ක් අතර කාලයක් බැංකු ගත නොකර අත රඳවා ගෙන තිබුණි. |
| **(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛය | - | චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍යවරයා විසින් හිමි වාහන 03 ට අමතරව අමාත්‍යාංශයේ වාහන 07 ක් පරිහරණයට ගෙන තිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

-----------------------------

| | | |
|---|---|---|
| 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛයේ 01 ඡේදය හා 2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | 205,142 | අමාත්‍යාංශ ලේකම්ට ලබාදුන් නිල වාහනයට අමතරව සංචිත වාහන 02 ක්ද පාවිච්චියට යොදාගෙන තිබුණි. |

**(ඈ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ**

-----------------------------

| | | |
|---|---|---|
| 1994 ජූනි 14 දිනැති අංක 95 දරන චක්‍රලේඛය | - | රන්මිහිතැන්න සම්බන්ධීකාරකට අනුමැතියකින් තොරව මසකට රු.2,000 ක දීමනාවක් 2011 මාර්තු මාසයේ සිට නොකඩවා ගෙවා තිබුණි. |

**3.11 කාර්යසාධනය**

-----------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ඉටුනොකර තිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) රූපවාහිනී විකාශනය හා සිනමාව සඳහා අංකන තාක්ෂණය හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි.

(ii) රන්මිහිතැන්න ජාතික ටෙලිසිනමා උද්‍යාන පදනම පනත බලාත්මක කර නොතිබුණි.

(iii) ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූලික අරමුණක් වූ මහජනතාවට ආරක්ෂාව, ආර්ථිකය පිළිබඳව සත්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීමට අදාළ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර පනත සම්මත කර නොගැනීම.

(iv) ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් ඇති කිරීම හා රූපවාහිනී ප්‍රචාරණ දැන්වීම් පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම.

(v) ගුවන් විදුලි සහ රූපවාහිනී නාලිකා පවත්වා ගැනීමට ස්ථිර බලපත්‍ර නිකුත් කිරීමක් හෝ අළුත් කිරීමේ ක්‍රමයක් සකස් කර ඒවා අධීක්ෂණය නොකිරීම.

(ආ) රන්මිහිතැන්න ටෙලිසිනමා ගම්මානයේ රූ ගත කිරිමට සහභාගී වන අයට කාමර පහසුකම් සැපයීමට ඒ,බී හා සී ශ්‍රේණියේ කාමර වර්ග 03 ක් යටතේ කාමර 43 ක් ඉදිකර තිබුණි. සමාලෝචිත වර්ෂයේදි ඒවායේ උපයෝජනය පිළිවෙලින් සියයට 20 ක්, සියයට 22 ක් හා සියයට 61 ක් වූ අතර එම උපයෝජනයෙන් වැඩි ප්‍රමාණයක් නොමිලේ පහසුකම් සැපයූ ඉන්දියානු චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් විය. තවද චිත්‍රපටි හා ටෙලිනාට්‍ය සඳහා චිත්‍රාගාරයක් ස්ථාපිත කර තිබුණද, 2014 වර්ෂයේදී එමගින් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ඇ) තරුණ තරුණියන් 161 දෙනෙකුගෙන් සමන්විත ශිල්පී සංචිතයක් පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ශිල්පිය සංචිතය සහභාගි කරගෙන වැඩමුළු දෙකක් රු.1,124,044 ක් වැයකර පවත්වා තිබුණි. නමුත් ඔවුන් කිසිදු නිර්මාණයකට දායක කරගෙන නොතිබුණි.

(ඈ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මට අනුව නිම කිරීමට යෝජිතව තිබුණු පහත සඳහන් කරුණු ඉටුකිරීමට කටයුතු කර නොතිබුණි.

(i) ගුවන්විදුලි සහ රූපවාහිනී නාලිකා සඳහා මාධ්‍ය බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු ඉටු කර නොතිබුණි.
(ii) සැලසිනේ ආයතනය රාජ්‍ය සමාගමක් ලෙස ස්ථාපිත කර නොතිබුණි.
(iii) ශ්‍රාවකයින් පදනම් කරගත් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.
(iv) සමාජ මාධ්‍ය ඒකකයක් පිහිටුවා නොතිබුණි.
(v) ජාතික විකාශන අධිකාරිය පිහිටුවීම සහ ජාතික චිත්‍රපටි සංස්ථා පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ සඳහන් කර තිබුණු පහත දැක්වෙන තොරතුරු නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(i) රන්මිහිතැන්න ආදායම පිළිබඳව අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

(ii) රන්මිහිතැන්න සිනමා උද්‍යානයේ සමාලෝචිත වර්ෂයේ රූ ගත කළ ටෙලිනාට්‍ය හා චිත්‍රපට පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(iii) මාධ්‍ය චාරිකා 07 ක් සිදුකළ බව සඳහන් කර තිබුණද එකදු චාරිකාවක් හෝ සිදුකර නොතිබුණි.

(iv) ආනයනික ටෙලිනාට්‍ය සඳහා රූපවාහිනී නාලිකාවලින් අයකළ රු.807,000 ක බදු ආදායම වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු මතභේදාත්මක ස්වරූපයේ වූ ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2013 වර්ෂයේදි මාස 04 ක පමණ කාලයකට අනුමත වූ නිවාඩු මත පෞද්ගලික සංචාරයකට අමාත්‍යවරයා විදේශගතව සිට පැමිණීමෙන් පසුව එම නිවාඩු කාලයටද අදාළව රු.1,314,000 ක මාසික ඉන්ධන දීමනා ගෙවා තිබුණි.

**3.13 අවිධිමත් ගනුදෙනු**

----------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු විධිමත් බවින් තොර වු ගනුදෙනුවක් පහත දැක්වේ.

නිලවාහන සඳහා අමාත්‍යවරයා හිමිකම් ලබන උපරිම මාසික ඉන්ධන දීමනාව වැටුප සමග ලබාගෙන තිබියදීත්, චක්‍රලේඛ නියමයන්ට පටහැනිව 2014 වර්ෂයේදී සංචිත වාහනයක් සඳහා ඩීසල් ලීටර් 5718 ක් වෙනුවෙන් රු.688,416 ක් වැයකර තිබුණි.

**3.14 පාඩු හා හානි**

---------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) බදු මුදල් ගෙවීමකින් තොරව ආනයනික වෙළඳ දැන්වීම් ප්‍රචාරය වන්නේද යන්න පසුවිපරම් කළ යුතු බවත්, එසේ සිදු නොකිරීම නිසා 2013 වර්ෂයේදී නියැදියකින් පමණක් හඳුනාගත් රජයට වූ අලාභය රු.2,500,000 ක් බව විගණනයෙන් පෙන්වාදී තිබුණි. 2014 වර්ෂයේදීද විගණන විමසුමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා නියැදියකින් පමණක්

අනාවරණයවූ ආනයනික වෙළඳ දැන්වීම් 06 කින් පමණක් රජයට සිදුවූ පාඩුව රු.3,000,000 ක් විය. ඒ අනුව විශාල ආදායමක් රජයට අහිමිවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රන්මිහිතැන්න ටෙලිසිනමා ගම්මානයේ ප්‍රවේශපත් අලෙවිය, රූ ගතකිරීම, කාමර පහසුකම් සැලසීම හා වෙනත් ආදායම්වල එකතුව රු.18,689,193 ක් වූ අතර එහි නඩත්තු හා අනෙකුත් කාර්යයන්ට වියදම රු. 70,546,070 ක් වූයෙන් වර්ෂයේ පාඩුව රු.51,856,877 ක් වී තිබුණි. ඉහත සඳහන් කළ වියදමෙන් රු. 46,623,393 ක් බොම්බෙ වෙල්වට් චිත්‍රපටයේ රංගන ශිල්පීන්ගේ නවාතැන් සහ ගුවන් ප්‍රවෙශ පත්‍ර ගාස්තු සඳහා විය.

## 3.15 විසඳා නොතිබුණු විගණන ජේද

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ජේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ජේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | වර්ෂය | ජේදය | |
| (i) | 2012 | 8 (ආ)(ii) | මහින්ද රාජපක්ෂ ටෙලිසිනමා උද්‍යානය සඳහා වෙනම පනතක් ඇති කිරීමට 2012 ක්‍රියාකාරී සැලැස්ම යටතේ සැලසුම් කර තිබුණද, 2015 ජූලි 20 දින වන විටත් එවැනි පනතක් සම්මත කර නොතිබුණි. |
| (ii) | 2012 | 12 (අ) | රන්මිහිතැන්නට නිකුත් කළ ප්‍රවේශපත් හා ලැබූ ආදායම අතර රු.99,305 ක ඌනතාවය අනාවරණය වී තිබුණත්, 2015 ජූලි 20 දින වන විටත් එ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (iii) | 2012 | 12(ඒ) | 2012 වර්ෂයේදී නිම කිරීමට යෝජිත ජනමාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහය 2015 ජූලි 20 දින වන විටත් නිමකර නොතිබුණි. |

(iv) 2012

ගුවන් විදුලි සහ රූපවාහිනී නාලිකා පවත්වා ගැනීමට බලපත්‍ර නිකුත් කිරීමේදී, ස්ථිර බලපත්‍ර වෙනුවට තාවකාලික බලපත්‍ර නිකුත්කර තිබූ අතර ස්ථිර බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීමේ ක්‍රමයක් සකස් කර නොතිබුණි. එබැවින් කිසිදු අධීක්ෂණයකින් තොරව නාලිකාවන්හි විකාශන කටයුතු දිගින් දිගටම සිදු කරනු ලබන බවත්, පසුව නිකුත් කර තිබූ තාවකාලික බලපත්‍රවල, පෙර සඳහන් නොවූ කොන්දේසිද ඇතුළත් කර තිබූ බැවින් ආයතන සම්බන්ධව ඒකාකාරී ලෙස තීරණ ගැනීමට නොහැකියාව හා තීරණ ගැනීමේ ගැටළු මතුවී තිබෙන බව නිරීක්ෂණය විය.

(v) 2013 5.11(ආ)

2006 අංක 11 දරන මුදල් පනතේ 6(1) වගන්තියේ දක්වා ඇති පරිදි ශ්‍රී ලාංකීය ගතිසිරිත් වර්ධනය කිරීමේ අදහසින් විදෙස් රටවල නිෂ්පාදනය කරන වැඩසටහන් මෙරට විකාශය කිරීම වෙනුවෙන් බද්දක් පනවා තිබුණි. බලපත්‍ර 15 ක් යටතේ ක්‍රියාත්මක වූ කේබල්, චන්ද්‍රිකා, අන්තර්ජාලය හා දුරකථන මත පදනම් වූ රූපවාහිනී නාලිකා තුළින් විකාශය වූ වැඩසටහන් මෙම බද්දට යටත් වි නොතිබුණි. මේ හේතුවෙන් අදාළ බද්ද පැනවීමේ පරමාර්ථයන් මෙරට තුළ ඉටු නොවන බව නිරීක්ෂණය විය. තවද, මෙම රැස්කර ගන්නා බදු ආදායම බැර කිරීමට අරමුදලක් පිහිටුවීමට 2009 වර්ෂයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ එකඟ වී තිබුණද එය 2015 ජූලි මාසය වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයට අදාලව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2014 ජනවාරි 22 දින ලබාදුන් නියෝග අතරින් 2015 ජූලි 20 දින වන විටත් නිම නොකළ නියෝග පහත දැක්වේ.

| රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| ----------------------- | | -------------------- |
| (i) | 05 | විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහාද පැමිණිලි කළ හැකි පරිදි ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් පනත සංශෝධනය කිරීම. |
| (ii) | 06 | ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූලික අරමුණක් වන මහජනතාවට ආරක්ෂාව, ආර්ථිකය පිළිබඳව සත්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීමට අදාළ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම හා ඒ සම්බන්ධව ඇතුළත් වාර්තාවක් කමිටුවට ඉදිරිපත් කිරීම. |
| (iii) | 07,08 | විකාශන සංවර්ධන අධිකාරි පනත සම්මත කිරීම හා පිහිටුවීම, අංකන තාක්ෂණය හඳුන්වා දීම හා ප්‍රගතිය පිළිබඳ කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කිරීම. |
| (iv) | 10 | ශ්‍රී ලංකාව ප්‍රතිසම තාක්ෂණය වෙතින් අංකන තාක්ෂණය වෙත මාරුවීම සඳහා භාවිතා කරනු ලබන්නේ ජර්මන් තාක්ෂණය වන DVB-T2 ද ජපන් තාක්ෂණය වන ISDB-T2 යන්න සඳහා අවසන් තීරණය ගැනීමේදී හා හඳුනාගැනීමට පෙර වැඩි රටවල් සංඛ්‍යාවක් දැනට භාවිතා කරනු ලබන තාක්ෂණය හා එම තාක්ෂණ උපකරණ සඳහා වැය වන පිරිවැය සැලකිල්ලට ගන්නා ලෙසත් එම තීරණය සඳහා සාමාන්‍ය මහජනතාවගේ අදහස් සැලකිල්ලට ගෙන අවසන් තීරණ ගන්නා ලෙසත් දන්වා තිබූ නමුත් මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමා ඉදිරිපත් කළ 2014 අගෝස්තු 08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව 2014 සැප්තැම්බර් 05 දිනට ආසන්න වශයෙන් රු මිලියන 17.396 ක ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා වන ජපාන නියෝජිත ආයතන (JICA)සමඟ ණය ගිවිසුමකට එළඹ ජපන් තාක්ෂණය |

ලබාගැනීමට කටයුතු කර තිබුණද එම ව්‍යාපෘතියද 2015 වර්ෂයේ සැප්තැම්බර් මාසය වන විට නවතා තිබුණි.

| | | |
|---|---|---|
| (v) | 12 | රාජ්‍ය මුදල් අයථා ලෙස පුද්ගලික පාර්ශවයන් වෙත යෑම වැලැක්වීමට පෞද්ගලික ගුවන් විදුලි නාලිකා හා රූපවාහිනී නාලිකා බලපත්‍රලාභීන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය, වාර්ෂිකව ගාස්තුවක් අයකිරීම හා බලපත්‍ර අළුත් කිරීමට නියමිත ක්‍රමවේදයක් ඇති කිරීම. |
| (vi) | 13 | බලපත්‍රලාභීන්ගේ නිවැරදි තොරතුරු සමාගම් රෙජිස්ට්‍රාර්ගෙන් ලබාගෙන කමිටුවට වාර්තාවන් ඉදිරිපත් කිරීම හා කේබල් චන්ද්‍රිකා හා අන්තර්ජාලය මත පදනම් වූ රූපවාහිනී ආයතන සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් ඇතිකිරීම. |
| (vii) | 15 | 2009 හා 2010 වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. |
| (viii) | 20 | (i) 2010 වර්ෂයේ කළ වියදම් වෙනුවෙන් අනුමැතිය ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම.<br>(ii) ආනයනය කරනු ලබන රූපවාහිනී වැඩසටහන් සඳහා අයකරන බදු ආදායම සඳහා අරමුදලක් ප්‍රමාදයකින් තොරව පිහිටුවීම. |
| (ix) | 26 | ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් ඇතිකිරීම හා රූපවාහිනී ප්‍රචාරණ දැන්වීම් පාලනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇති අතර ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීම. |

## 3.16 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය සංස්ථා 2 කින් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට 2010,2011,2012 හා 2013 වර්ෂයන්හි දී මුදාහළ සේවකයින් 13 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු. 6,217,843 ක වැටුප්ද, රු.2,567,008 ක අතිකාලද එම සංස්ථා විසින් ගෙවා තිබුණද, අමාත්‍යාංශය විසින් ඔවුන් අනුයුක්ත කරන ලද අංශ, පැමිණීම සනාථ කිරීම්, අතිකාල සේවයේ යෙදුණු බව තහවුරු කිරීම් කිසිවක් විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් විය.

(ආ) කේබල් රූපවාහිනි සඳහා බලපත්‍ර 2012 වර්ෂයේදි ලබාගත් ආයතනයක් නීතිවිරෝධී ආකාරයට කටයුතු කර තිබෙන බව 2013 වර්ෂයේදී සනාථ වී තිබියදීත් අමාත්‍යාංශය විසින් එම ආයතනය සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද

රාජ්‍ය ගිණුම් කාරක සභා නියෝග අනුව කේබල් චන්ද්‍රිකා හා අන්තර් ජාලය මත පදනම් වූ රූපවාහිනී ආයතන සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් ඇති නොකර, 2014 නොවැම්බර් මාසයේදී චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ රූපවාහිනී ජාලයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාදී තිබුණි.

(ඇ) රන්මිහිතැන්න සිනමා ගම්මානයේ දොරටු ප්‍රවේශපත්‍ර ලෙස මුද්‍රණය කළ ටිකට්පත් නිකුත් කිරීම අනුක්‍රමික අංක පිළිවෙලට සිදු නොකර, දොරටු ප්‍රවේශ පත්‍ර අලෙවිකිරීමට බාහිරින් සේවයට යොදවාගෙන තිබුණු ආරක්ෂකයින්ට පවරා දුන්නත් ප්‍රවේශපත්‍ර නිකුත්කිරිම සහ ඒවා නැවත ලබාගැනීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සිදුනොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව රු.50 ක ටිකට්පත් පිළිබඳ කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී නිකුත්කළ හා විකුණූ ටිකට්පත් අංක සැසදීමේදී රු.3,739,550 ක් වටිනා ටිකට්පත් 74791 කට අමාත්‍යාංශයට මුදල් ලැබී නොමැති අතර ඒවා අවලංගු කළ, පාවිච්චි කළ නොහැකි බව හෝ අමාත්‍යාංශයට දන්වා නොතිබුණි. ඒ පිළිබඳ අමාත්‍යාංශය විසින් කරුණු විමසීමක්ද කර නොතිබුණි. තවද 2014 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවල ටිකට්පත් ආදායම පමණක් එවා තිබූ අතර, අලෙවි කළ ටිකට් පත්වල අංක පිළිබඳ වාර්තා කර නොතිබීමේ හේතුවෙන් එවා තිබුණු ආදායමේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

## 3.17 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

-----------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 14 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 101 | 78 | 23 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 34 | 31 | 03 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | එකතුව | 154 | 125 | 30 | 01 |

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

-------------------------------------------------------

අමාත්‍යාංශය විසින් වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | තනතුර | සංඛ්‍යාව | ලබාගත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| ප්‍රාථමික | රියදුරු | 02 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 2010.08.02 සිට මේ දක්වා |
| -එම- | රියදුරු | 01 | එම- | 2011.10.03 සිට මේ දක්වා |
| -එම- | කා.කා.ස. | 02 | එම- | 2010.08.02 සිට මේ දක්වා |
| ප්‍රාථමික | නිෂ්පාදන සහායක | 01 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | 2010.12.01 සිට මේ දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| -එම- | කම්කරු (කොන්ත්‍රාත්) | 01 | එම- | 2011.07.11 සිට මේ දක්වා |
| | කම්කරු- (කොන්ත්‍රාත්) | 01 | එම- | 2012.08.13 සිට මේ දක්වා |
| | මුද්‍රණ කාර්ය සහායක (කොන්ත්‍රාත්) | 01 | එම- | 2013.06.03 සිට මේ දක්වා |
| | ආරක්ෂක පරිපාලක (කොන්ත්‍රාත්) | 01 | එම- | 2012 08 .01 සිට මේ දක්වා |
| ද්විතියික | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) | 01 | -එම- | 2011.06.22 සිට මේ දක්වා |
| | | 01 | -එම- | 2011.12.16 සිට මේ දක්වා |
| | | 01 | -එම- | 2011.12.16 සිට මේ දක්වා |

**4. ශීර්ෂය 210 - ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** | **නිරීක්ෂණ** |
|---|---|---|
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |
| බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) | යාවත්කාලින කර නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලින කර නොතිබුණි. |

## 4.2 විගණන සාක්ෂි ඉදිරිපත් නොවීම

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාධ්‍ය සාකච්ඡා 14 ක්, සම්මන්ත්‍රණ 11ක් හා වැඩ මුළු 03 ක් පැවැත්වීම සඳහා වූ වියදම් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුවේ නොතිබීම නිසා එකතුව රු.5,067,566 ක වියදමට අදාළවූ ගනුදෙනු 28 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මාධ්‍යවේදීන් ප්‍රවාහනයට රු. 1,560,532 ක් වැය කර තිබුණත්, ඒ සම්බන්ධව එක් එක් මාධ්‍ය චාරිකා සඳහා අනුමත ඇස්තමේන්තු, මාධ්‍ය චාරිකාවට සහභාගි වූ නිලධාරීන්ගේ තොරතුරු හා පැමිණීම තහවුරු කෙරෙන අත්සන් ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම වියදම පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

(ඇ) දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශය විසින් 2014 වර්ෂයේදී සිදුකළ වැඩසටහන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

---------------------------------------

දෙපාර්තමේන්තුව වෙත ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 02 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගනුදෙනුවල වටිනාකම රු 2,309,772 ක් විය.

**4.4 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**--------------------**

වැය විෂයයන් 18 කට රු.3,858,429 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**4.5 අග්‍රිම ගිණුම්**

**--------------**

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය සීමාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය මත රු.60,000 දක්වා වැඩි කරගෙන තිබුණත්, එම සීමාවද අවස්ථා 04 කදී ඉක්මවා නිලධාරීන් දෙදෙනකුට එකතුව රු.455,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**4.6 පොදු තැන්පත් ගිණුම**

**-------------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 14ක් විසින් විවිධ කාර්යයන්ට ලබාදුන් රු.2,494,149 ක මුදලින් අදාළ කාර්යයන් ඉටු නොකර එම මුදල් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි .

(ආ) ගොඩනැඟිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත් වෙනුවෙන් වර්ෂ 03ක කාලයක සිට පැවත එන රු.7,488,592 ක රඳවාගැනීම්ද, ලීබඩු උපකරණ සැපයීමේ කොන්ත්‍රාතුවක් වෙනුවෙන් රු.886,080 ක රඳවා ගැනීම්ද, තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. මෙම මුදල් කොන්ත්‍රාත් සඳහා රු.5,640,157 ක වැඩිපුර ගෙවීම් වෙනුවෙන් අයකිරීමට 2013 වර්ෂයේදී තීරණය කර තිබුණද 2015 ජූනි මාසය දක්වාම එසේ කර නොතිබුණි.

## 4.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

විෂය අංක 21001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩුව නිරික්ෂණය විය.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.265,772 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 09 ක සිට වර්ෂ 17 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන නමුත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 4.8 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

--------------------------------------

### 4.8.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තාව සමඟ මුල්‍ය ප්‍රගතිය සැසඳිය හැකි ආකාරයට පිළියෙල කර නොතිබුණි.

### 4.8.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 ජනවාරි 09 දින පිළියෙල කර තිබුණත්, අමාත්‍යාංශය විසින් එය අනුමත කර නොතිබුණි. 2014 වර්ෂයේදී සිදු කළ රු. 7,237,370 ක ප්‍රසම්පාදනයන් 03 ක් එම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත්ව නොතිබුණි.

### 4.8.3 අභ්‍යන්තර විගණනය

-------------------------

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණත්, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් දෙපාර්තමේන්තුවේ විගණන කටයුතු සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණන විමසුම් 13 නිකුත්කර තිබුණද, එම විගණන විමසුම් සඳහා 2015 ජූලි 30 දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

### 4.8.4 විගණන හා කළමනාකරණ කමිටුව

---

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

### 4.9 වත්කම් කළමනාකරණය

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

#### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකර සියයට 2.1 ක පොලී අනුපාතිකයක් මත 1999 දෙසැම්බර් 10 දින සැපැයුම්කරු හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ එළඹි ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබුණු ණය ආධාර යටතේ ප්‍රංශ ප්‍රෑන්ක් 9,150,000 (යූරෝ 1,442,601 කට සමාන රු.මිලියන 102.2) කට 2003 වර්ෂයේ ස්ථානගත කළ යන්ත්‍ර නිෂ්ක්‍රීයව හා නිසි නඩත්තුවකින් තොරව 2015 ජූලි දක්වාම පැවතුණි. මෙම ගැටළුව නිරාකරණය කිරීමට 2010 වර්ෂයේ පත් කළ ත්‍රිපුද්ගල කමිටුවේ නිර්දේශය වූයේ ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් මඟින් අලෙවි කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම වුවත් එපරිදි කටයුතු සිදු කර නොතිබුණි.
කොටස් 04 ක් යටතේ ලබාගත් ඉහත ණය මුදල සඳහා 2013 ජූලි 25 දිනට ණය මුදලින් යූරෝ 404,590 ක් ගෙවන විට, ඒ සඳහා යූරෝ 308,352 ක පොලියක් ගෙවා තිබුණි. ගිවිසුමේ සඳහන් පොලී අනුපාතය සියයට 2.1 ක් වුවද, ඉන් බැහැරව 2000029 හා 2000061 යන ණය වර්ග 02 සඳහා සියයට 6.13 ක් බැගින් 2013 ජූලි වන විට යූරෝ 172,295 ක වැඩි පොලී අනුපාතයක් යටතේ ගෙවා තිබුණි. (විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව) රජයට සිදුවූ රු.1,048,391 ක අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයක් හඳුනාගැනීමට 2015 ජූලි මාසය වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව යටතේ පවත්නා රජයේ ප්‍රකාශන කාර්යාංශයේ විකුණුම් ඉන්වොයිසි සැකසීම, පාරිභෝගිකයින්ට තොග හඳුනාගැනීමට පහසුකම් සැලසීම,

තොග ලේඛනගත කිරීම පිළිබඳ පරිගණක මෘදුකාංගයක් රු.600,000 ක් ගෙවා 2008 වර්ෂයේදී හඳුන්වා දී තිබුණු නමුත්, විකුණුම් ඉන්වොයිසි සැකසීම හැර අනෙකුත් කාර්යයන්ට මෙම පරිගණක මෘදුකාංගය 2015 ජූලි 30 දින වන විටත් භාවිතා කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ii) 2013 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව 2015 ජූලි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

-----------------------------

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට බේරුම් නොකළ වර්ෂයට අඩු කාලයක සිට පැවැත එන රු.10,689,225 ක බැරකම් පැවැතුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය ලෙජරයෙහි බැරකම් සටහන් කර නොතිබුණි.

(ii) ප්‍රතිපාදන සීමාව ඉක්මවා ප්‍රාග්ධන හා පුනරාවර්තන වැය විෂයයන් 03 කට හා 08 කට පිළිවෙලින් රු. 2,025,677 ක හා රු. 4,741,777 ක බැඳීම්වලට එළඹ තිබුණි.

(iii) පුද්ගලික ආයතනයකට ගෙවීමට තිබුණු රු. 35,000 ක බැරකමක් විසර්ජන ගිණුමෙහි බැරකම් යටතේ දක්වා නොතිබුණි.

## 4.10 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XXXII පරිච්ඡේදයේ 2:3:4 වගන්තිය සහ 1989 ජනවාරි 05 දිනැති අංක 01/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරියෙකු බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වී ගිය අතර ඒ සඳහා නිවාඩු අනුමත කර හෝ නිදහස්කර ගැනීමකින් හෝ තොරව 2014 මාර්තු 30 දිනෙන් පසු සේවයට වාර්තා කර නොතිබුණි. |
| **(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 104 (1) | 2014 වර්ෂයේදී වාහන දෙකකට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නොතිබුණි. |

## 4.11 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථාවක් පහත දැක්වේ.

විශේෂ ජාතික වැදගත් අවස්ථාවන් (ලංකාවේ පළමු නිදහස් උත්සවය වැනි), සංවර්ධන ව්‍යාපෘතීන් හා වෙනත් ව්‍යාපෘතීන් පිළිබඳ නිෂ්පාදිත කෙටි චිත්‍රපට හා වාර්තා වැඩසටහන් සංරක්ෂණය කිරිම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වී තිබුණි. චිත්‍රපට සංරක්ෂණාගාරය නවීකරණය කරන ලෙස වර්ෂ ගණනාවක සිට එම අංශයේ නිලධාරීන් ඉල්ලුම් කර තිබුණද, 2014 වර්ෂයේදීත් එය ආරම්භකර නොතිබුණි. ප්‍රමුඛතාවය ලබාදිය යුතු මෙම කාර්යය ඉටු නොකිරීම නිසා සංරක්ෂණාගාරය නිසි ප්‍රමිතියකට නොමැතිවීමත්, එහි සේවයේ නියුතු නිලධාරියාගේ සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති වී තිබුණු බවත්, රසායනාගාරයකට උචිත ලෙස වායු සමීකරණ යන්ත්‍ර සවිකර නොමැති බැවින් රසායන ද්‍රව්‍යවල බලපෑම මත වායු සමීකරණ යන්ත්‍ර නිතර අක්‍රියවීම සිදුවන බව විගණනයට වාර්තා වී තිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

-----------------

ක්‍රියාකාරි සැලැස්මෙහි දක්වා තිබුණු ක්‍රියාකාරකම් 93 කින් 10 ක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භකර නොතිබුණි.

**(ඇ) කාර්යසාධන වාර්තාවේ සඳහන් තොරතුරු නිවැරදි නොවීම**

-------------------------------------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) කාර්යසාධන වාර්තාවේ දක්වා තිබූ ක්‍රියාකාරකම් 93 කින් ක්‍රියාකාරකම් 13 කින් සමන්විත නියැදියක් පරීක්ෂා කිරීමේදී එක් එක් අංශවලින් විගණනය කර ලබාගත් තොරතුරු සමග සැසඳීමේදි අංශ 08 ක් විසින් දක්වා තිබූ තොරතුරු නිවැරදි නොවන බව අනාවරණය විය.

(ii) ක්‍රියාකාරි සැලැස්මට අනුව ශබ්ද අංශය අළුත්වැඩියා කිරීමේ කාර්යය සම්පූර්ණ කර ඇති බව දක්වා තිබුණද, 2015 ජූලි 30 දින වන විට මුළු ප්‍රසම්පාදන වටිනාකමෙන් සියයට 20 ක ප්‍රමාණයක් පමණක් නිම කර තිබුණි.

**4.12 අවිධිමත් ගනුදෙනු**

**----------------------**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**----------------------------------------------------------------------**

සම්පූර්ණ වර්ෂය සඳහාම ආහාර මිලදී ගැනිමට හා වාහන කුලියට ගැනීම යන කොන්ත්‍රාත්තු දෙක සඳහා විවෘත දැන්වීමක් මගින් සැපයුම්කරුවන් ලියාපදිංචි කරගත යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව තෝරාගත් සැපයුම්කරුවන් කීපදෙනෙකු මගින් මිල ගණන් කැඳවා තිබුණි. එසේ ලබාගත් මිල ගණන් අනුව එක් එක් කාර්යයට එක් සැපයුම්කරුවකු බැගින් පමණක් තෝරා ඔවුන් ලියාපදිංචි කර වර්ෂය පුරාම එම සැපයුම්කරුවන් දෙදෙනාගෙන් ඉහත සඳහන් මිලදී ගැනීම සහ සේවා සැපයීම සඳහා ඉටු කරවා ගෙන රු.6,351,661 ක් වැය කර තිබුණි.

**4.13 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

**---------------------------------------------**

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ මාධ්‍ය සාකච්ඡා හා වෙනත් විශේෂ අවස්ථා සඳහා කෙටි ආහාර ලබා ගැනීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී සේවා ගාස්තුව නොසළකා ඇගයීම් කර කොන්ත්‍රාත්කරු තෝරා ගෙන පසුව 2013 වර්ෂයේදී සියයට 40 ක් හා 2014 වර්ෂයේදී සියයට 50 ක සේවා ගාස්තුවක් එකතුකර ගෙවීම කර තිබුණි. මේ හේතුවෙන් 2013 ජනවාරි මාසයේ සිට 2014 ඔක්තෝබර් මාසය දක්වා රු.5,400,534 ක් ගෙවා තිබුණි. 2015 මැයි 28 දින සේවා ගාස්තුව සියයට 10 දක්වා අඩුකිරීමට ඔවුන් විසින්ම එකගවීම මත සේවා ගාස්තු ලෙස ඉහත කාලයට ගෙවූ රු1,557,755 කින් රු.1,173,476 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) නව මාධ්‍ය මධ්‍යස්ථානයට විදුලිය සැපයීමේ ප්‍රධාන විදුලි රැහැන ඇතිරීමට අවශ්‍ය කේබලය ප්‍රමාණ පත්‍රයට අනුව විශේෂ ඇණවුමක් මගින් ලබාගෙන උපදේශන සමාගමේ නිර්දේශය මත සැපයිය යුතු බව සඳහන් කර තිබුණි. එම ඇණවුම හෝ මිලදී ගත් ඉන්වොයිසිය හෝ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, වෙළඳපලේ පවතින මිලට වඩා අසාමාන්‍ය වැඩි මිලකට එනම්, මීටරයක් රු. 26,723 බැගින් මීටර් 394 ක් සඳහා රු.10,528,862 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි .ඊට අමතරව 2014 ජුනි 06 දින විදුලි බල මණ්ඩලයේ විශේෂඥ සේවා සහය ලබා කොන්ත්‍රාත්කරුද සමග මෙම විදුලි රැහැනේ පවතින සත්‍ය දිග මැනීමේදී මීටර් 74 කට රු.1,977,502 ක් වැඩිපුර ගෙවා ඇති

බව තහවුරු විය. එසේ වුවද 2015 ජූලි 30 දින වන විටත් වැඩිපුර ගෙවා තිබුණු මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොගැනීම ගැටළු සහගත විය.

(ඇ) දෙපාර්තමේන්තුවේ මාධ්‍ය සමාජයේ බීමහල පවත්වාගෙන යාම වෙනුවෙන් බාහිර පුද්ගලයෙකුගෙන් රු. 4,653,515 ක් අයකර ගත යුතුව තිබුණි. එම මුදල අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් නීතිමය කටයුතු කිරිම සඳහා 2014 පෙබරවාරි මාසයේදී නීතිපති වෙත ඉදිරිපත් කර තිබුණි. නමුත් නීතිපතිගේ කැඳවීමටද දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිචාර දක්වා නොතිබුණි. එම බාහිර පුද්ගලයාට ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නමින් නිකුත්කර තිබුණු මත්පැන් බලපත්‍රය පවරා ඇති බව ශ්‍රී ලංකා සුරාබදු කොමසාරිස් ජනරාල් ඇමැතු 2015 ජනවාරි 02 දිනැති ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් දන්වා තිබුණි. තවද එම බීමහල කොළඹ පිහිටි බාහිර පුද්ගලයා විසින් බදුගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බවත් එහි සඳහන් කර තිබුණි. ඒ අනුව 2015 ජූලි 30 දින වන විටත් අයකරගත යුතු මුදලක් සම්බන්ධයෙන් නීතිපති මගින් නෛතික කටයුතු කරමින් පවතින අවස්ථාවක එම පුද්ගලයා හට කිසිම ගිවිසුමකින් තොරව හා කිසිදු මුදලක් අයකිරීමෙන් තොරව මත්පැන් බලපත්‍රය ලබාදීම වංචනික ක්‍රියාවක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.14** **පාඩු හා හානි**

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය මධ්‍යස්ථානය රු.200,763,112 ක ඇස්තමේන්තුගත වටිනාකමකට ඉදිකිරීමට පුද්ගලික ආයතනයකට ලබාදුන් කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු.196,080,674 ක් ගෙවා තිබුණි. එයින් රු.6,623,624 ක් වැඩිපුර ගෙවීමක් බව ගෙවීම් සහතික කළ උපදේශන සමාගම පිළිගෙන තිබුණත්, ඒ බව අදාළ කොන්ත්‍රාත්කරුට ලිඛිතව දැනුම් දීමට හෝ වැඩිපුර ගෙවූ එම මුදල නැවත කොන්ත්‍රාත්කරුගෙන් අයකරගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) නව මාධ්‍ය මධ්‍යස්ථානයෙහි 700 $m^2$ ක පමණ වපසරියකින් යුතු ශ්‍රවණාගාරය ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබුණි. උපදේශන සමාගම විසින් 2011 නොවැම්බර් 02 දින ගොඩනැඟිල්ල භාරගෙන මාස 6 ක් ඉක්මයාමට ප්‍රථම අනාවරණය වූ අඩුපාඩු 2013 වර්ෂයේ කළමනාකරණ විගණන වාර්තාවේ දක්වා තිබුණත් එම අඩුපාඩු 2015 ජූලි 30 දින වන විටත් නිවැරදි කර නොතිබුණි.

(ඇ) කොළඹ මහ නගර සභාවෙන් සහ ප්‍රධාන ගිනි නිවීමේ නිලධාරියකුගේ වාර්තා ලබාගැනීමකින් තොරව හා නිසි ප්‍රමිතියකින් තොරව නව ගොඩනැඟිල්ලේ සකස් කර තිබූ ගිනි ආරක්ෂිත දොරවල් 04 ක් සඳහා උපදේශන ආයතනයේ නිර්දේශ මත රු.410,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණත් 2015 ජූලි 30 දින වන විටද ප්‍රමිතියට අනුව එම දොරවල් සකස් කර නොතිබුණි.

(ඈ) මාධ්‍යවේදීන් ප්‍රවාහනයට කුලී පදනම මත බස්රථ ලබා ගැනීමේ ප්‍රසම්පාදනය ඇගයීමේදී කෙටි දුර ධාවනය සඳහා කිලෝ මීටරයක ගාස්තුව ඇගයීම වෙනුවට අවම කිලෝ මීටර් 150 කට ගෙවීමට එකග වී තිබුණි. ඒ අනුව කිලෝ මීටර් 150 කට අඩුවෙන් ධාවනය කළ ගමන් වාර 15 ක් සඳහා එකතුව කිලෝමීටර් 645 ක් වී තිබුණත්, ගෙවීම් කිරීමේදී ගමන් වාරයකට අවම කිලෝ මීටර් 150 බැගින් කිලෝමීටර් 2250 කට ගෙවීම නිසා රජයට රු.177,620 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 4.15 අනාර්ථික ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) යුධ වාතාවරණ සමයේ රටේ පැවති ආරක්ෂක තත්ත්වය මත අතිගරු ජනාධිපතිතුමා සහභාගිවන රැස්වීම්වලට සියළුම මාධ්‍ය ආයතනවල මාධ්‍යවේදීන් ප්‍රවාහනය, නවාතැන් හා ආහාර දෙපාර්තමේන්තුව විසින් සපයා තිබුණි. නමුත් යුධ වාතාවරණයක් නොමැති වර්තමානයේදීද මාධ්‍යවේදීන්ට එම පහසුකම් සැපයීම වෙනුවෙන් හා ප්‍රවාහනයට රු.918,360 ක් ද ඔවුන්ගේ නවාතැන් හා ආහාර සඳහා රු.642,172 ක් ද වශයෙන් එකතුව රු.1,560,532 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි.

(ආ) මාධ්‍ය මධ්‍යස්ථාන සඳහා ලීබඩු සැපයීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් විගණනයෙන් පෙන්වා දුන් අඩුපාඩු අතරින් වැඩිපුර ගෙවා තිබුණු රු.1,184,700 කින් රු.1,037,200 ක් රඳවා ගැනීම් වලින් අඩුකර ගන්නා බව 2014 ජනවාරි 31 දින දන්වා තිබුණි. නමුත් විගණනයෙන් පෙන්වා දුන් අනෙකුත් අඩුපාඩු එනම්, මල බැඳීම්, පිරිවිතරවලින් බාහිරව ලෙදර් භාවිතා කිරීම යනාදී දුර්වලතා නිවැරදි කරගැනීමට 2015 ජූලි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4.16 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් 2015 ජූලි 30 දින වන විටත් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2012 | 4 (අ) | නව මාධ්‍ය මධ්‍යස්ථානයට ලී බඩු සැපයීම පිළිබඳව උපදේශන සමාගමේ සහාය ඇතිව කළ භෞතික විගණන පරික්ෂාවේදී අනාවරණය වූ පරිදි එකග වූ ප්‍රමිතීන්ගෙන් සහ පිරිවිතරවලින් බැහැරව අයිතම් 12 ක් සඳහා රු. 3,522,700 ක් ගෙවීම හා එකග වූ පිරිවිතරවලින් බැහැරව රු. 2,568,800 කට සැපයූ භාණ්ඩ වර්ග 03 ක් පාවිච්චි කළ නොහැකි තත්ත්වයෙන් පැවතීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම. |
| 2012 | 7(ආ ආ)(i) | නව මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.200,763,112 කට පෞද්ගලික සමාගමට ලබාදී තිබුණු අතර විගණනය ලිඛිතව ඉල්ලා සිටි උප කොන්ත්‍රාත් ලේඛනය, වගකීම් සහතික (විදුලි උපකරණ, වායු සමීකරණ යන්ත්‍ර,ගිණි ආරක්ෂිත දොරවල් ) සියලුම ටෙන්ඩර්කරුවන්ගේ ලංසු ලියවිලි හා පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත්කිරීමේ ගිවිසුම, ආදී තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි වීම. |
| 2012 | 7(ආ ආ)(ii) | නව මාධ්‍ය මධ්‍යස්ථානයට රු.23,997,597 ක වියදමකින් පෞද්ගලික ආයතනයකින් ලී බඩු මිලදී ගැනීමේදී, එම සමාගමේ ලංසු කැඳවීමට අදාළ මුල් පිටපත හෝ එහි අනුපිටපත විගණනයට ඉදිරිපත් කර නොතිබීම. |

## 4.17 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පර්යේෂණ විෂයය හැදෑරූ උපාධිධාරි නිලධාරීන් තිදෙනෙක් ඇතුළු නිලධාරීන් 07 දෙනෙකු සේවයේ නියුක්ත කර විශේෂ පර්යේෂණ ඒකකයක් 2012 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර තිබුණි. එසේ තිබියදී 2014 මාර්තු 17 දින ක්ෂේත්‍ර සමීක්ෂණ දෙකකට රු.3,380,000 ක් බාහිර ආයතනයකට ගෙවා තිබුණි. තවද එම සමීක්ෂණය සඳහා ආයතනයක් තෝරා ගැනීමට ලංසු කැඳවීමේදී හා ඇගයීමේදී පර්යේෂකයින්ගේ සුදුසුකම් හා ආයතනයේ පූර්ව සුදුසුකම් ඇගයීමට ලක් කර නොතිබුණි.

(ආ) ඉහත ක්ෂේත්‍ර සමීක්ෂණ වාර්තාව 2014 අප්‍රේල් මාසයේදී ලැබී තිබුණු නමුත් එය දෙපාර්තමේන්තුවේ අරමුණුවලට අනුව යොදා ගෙන ප්‍රතිලාභයක් ලබාගත් බව හා ඒ පිළිබඳ ඇගයීමක් කළ බව විගණනයේදී නිරීක්ෂණය වී නොතිබුණි.

## 4.18 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 08 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 16 | 06 | 10 |
| (iii) | ද්විතියික මට්ටම | 236 | 180 | 56 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 51 | 47 | 04 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 21 | 10 | 11 |
| | **එකතුව** | **339** | **251** | **88** |

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | ලබාගත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | කැළණිය විශ්ව විද්‍යාලය | 2010.05.07 සිට 2014.12.31 දක්වා |
| | . | රූපවාහිනී සංස්ථාව. | 2010.08.01 සිට 2014.12.31 දක්වා |

## 5. ශීර්ෂය 211- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### 5.1 ගිණුම් ඉදිරිපත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් 2015 මාර්තු 31 දින වන විට අංක 20.03.02.05 දරන ආදායම් සංතක්තය යටතේ වන මුද්‍රණ ආදායම් ගිණුම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එම ගිණුම මාස 1 ½ කට වැඩි කාල පමාවකින් පසුව 2015 මැයි 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 5.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | ආදාල රෙගුලාසි |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

| | | |
|---|---|---|
| (v) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (vi) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (vii) | වාහන ලැයිතුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |
| (viii) | ණය හා අත්තිකාරම් ලේඛනය | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09(1) ඡේදය |
| (ix) | තාක්ෂණික ඇගයීම් කමිටු පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (x) | තාක්ෂණික කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 මාර්ගෝපදේශය |

**5.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

**--------------------------------**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් දෙකකට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 04 කට 2015 අගෝස්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි වටිනාකම රු.164,264,838 ක් විය.

**5.4 විසර්ජන ගිණුම**

**----------------**

**අයවැය විචලනය**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.500.000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක සිට සියයට 94 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**5.5 අග්‍රිම ගිණුම**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 11 කට අදාලව ලබා දී තිබුණු එකතුව රු.120,210 ත් වූ අතර තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කිරීමට මාස 1 ක සිට මාස 4 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වී තිබුණත්, එම රෙගුලාසිවලට පටහැනිව අවස්ථා 11 කදී නිලධාරීන් 03 ක් වෙත රු.20,000 ක් ඉක්ම වූ එකතුව රු.680,178ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබුණි.

(ඇ) විධිමත් අනුමැතියක් රහිතව රු.7,500 ක සීමාව ඉක්මවා රු.50,000 ක සුළු මුදල් අග්‍රිම නිකුත් කර තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් පියවීම සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 20 දිනැති අංක 04/2014 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව පහත පරිදි කටයුතු කර නොතිබුණි.

(i) ඉහත චක්‍රලේඛයේ 2. 1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තම කාර්යාලයේ හා උප කාර්යාලවල ගිණුම් පියවීම පිණිස වගකිව යුතු මාණ්ඩලික නිලධාරියකු පත්කර නොතිබුණි.

(ii) ඉහත චක්‍රලේඛයේ 2. 1 ඡේදය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය පිළිබඳ සටහන් බැංකුවට භාර දී බැංකුව මගින් හර නිවේදනයක් ලබාගෙන එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත 2015 ජූලි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 5.6 පොදු තැන්පත් ගිණුම

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ දෙකක් ඉක්මවූ එකතුව රු.7,092,740 ක්වූ තැන්පතු 26 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) කෝට්ටේ මහ නගර සභාව විසින් මුද්‍රණ කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.2,050,000 ක මුදල් අදාල කාර්යභාර්යයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 5.7 ආදායම් ගිණුම

---------------

රජයේ මුද්‍රණාලයාධිපති ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් අංක 20.03.02.05 දරන ආදායම් සංකේතය යටතේ සේවා ගාස්තු - රජයේ මුද්‍රණ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම,

ආදායම් රැස්කිරීම, ගිණුම් ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාර්ය පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාලව සිදුකළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.650,264,550 ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම වර්ෂ 1 ක සිට වර්ෂ 26 ක් දක්වා කාල පරාසයකට අදාල විය. හිඟහිටි ආදායම අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි.

(ii) වසර 17 ක කාල පරිච්ඡේදයක සිට පැවැත එන රු. 138,288,612 ක හිඟ ණය ශේෂයෙන් කිසිදු මුදලක් 2014 වර්ෂයේ දී අයකරගෙන නොතිබුණි. වර්ෂ 7 ක කාලපරිච්ඡේදය සඳහා වූ රු.114,713,546 ක හිඟ ණය ශේෂයෙන් 2014 වර්ෂයේ දී සියයට 26 ක ප්‍රමාණයක් පමණක් අය කරගෙන තිබුණි.

## 5.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 21101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රතාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.6,164,028 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 3 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන ශේෂ විය. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) මියගිය, විශ්‍රාම ගිය හා වෙනත් රාජ්‍ය ආයතනවලට ස්ථාන මාරුවීම් ලබා ගිය දීර්ඝ කාලයක සිට පැවත එන ණය ශේෂය රු.597,818 ක් විය.

## 5.9. යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 5.9.1. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විට පිළියෙල කළ යුතු වුවත්, එය 2014 අප්‍රේල් 02 දින පිළියෙල කර තිබුණි.

**5.9.2. අභ්‍යන්තර විගණනය**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද දෙපාර්තමේන්තුවේ කාර්යයන් විගණනය කිරීම සම්බන්ධ වන අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.

**5.9.3 විගණනය හා කළමනාකරණ කමිටුව**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය පරිදි සෑම විගණන හා කළමනාකරණ කමිටුවක් අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතු වුවද, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේදී කමිටු රැස්වීම් වාර 02ක් පමණක් පවත්වා තිබුණි.

**5.9.4 වත්කම් කළමනාකරණය**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර - | | |
| Kord 06 | 01 | වසර 15කට වැඩි |
| Mozp | 01 | වසර 02 කට වැඩි |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව

විසින් එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණ අතර එම වාර්තා 2015 ජූලි 20 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

## 5.10 අනුකූල නොවීම්

(අ) **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විස්තර කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| VII වන පරිච්ඡේදයේ 12.2.5 වගන්තිය | 316,000 | මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සහකාර රජයේ මුද්‍රණාලයාධිපති තනතුරේ වැඩ ආවරණය කිරීම වෙනුවෙන් නිලධාරීන් 18 දෙනෙකු වෙත නිෂ්පාදන තත්ත්වය නගා සිටු වීම සඳහා වූ දීමනාවක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| **(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| • මුදල් රෙගුලාසි 104(1) සහ (3) | 3,181,868 | සමාලෝචිත වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 10 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| • | මුදල් රෙගුලාසි 104(4) | 3,443,642 | 2002, 2007 සහ 2012 යන වර්ෂයන්වල සිදු වී තිබූ වාහන අනතුරු 3 ක පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට වර්ෂ 1 ක සිට වර්ෂ 12 ක් දක්වා කාලයක් ගත වී තිබුණි. 2012 හා 2014 වර්ෂයන්වලදී සිදු වී තිබූ වාහන අනතුරු 5 සම්බන්ධයෙන් විගණන දිනය වූ 2015 මැයි මාසය වන විටත් පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| • | මුදල් රෙගුලාසි 110 | 3,448,642 | සමාලෝචිත වර්ෂයේදී සිදු වී තිබුණු පාඩු හා අලාභහානි සම්බන්ධයෙන් වූ තොරතුරු හානි පිළිබඳ ලේඛනයේ ඇතුළත් කර එම ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| • | මුදල් රෙගුලාසි 1645 (අ) | 6,586,592 | දෙපාර්තමේන්තුව සතු සංචිත වාහන 14 ක් සඳහා 2014 වර්ෂයේ දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| • | මු. රෙ. 1645 (ආ) | 3,473,638 | යොමු ගත රෙගුලාසිය ප්‍රකාරව සංචිත හා වෙන්කළ වාහන සඳහා වන ලොග් පොත විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | 2008 ජුනි 24 දිනැති අංක ඒ/ශී/06/71/02/01 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | 929,402 | යථෝක්ත ලිපියේ උපදෙස් පරිදි පෞද්ගලික අංශයෙන් ලැබිය යුතු ණය ශේෂ අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක සිට ලැබිය යුතු හිඟ ණය ශේෂය රු.929,402 ක් වී තිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

**---------------------------------------**

2012 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වෙනත් ආයතනවල මුද්‍රණ කටයුතු වෙනුවෙන් අයකර තිබූ රු.25,394,988 ක් වූ එකතු කළ අගය මත බදු මුදල් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හා 2013 අංක 17 දරන සංශෝධිත පනතේ

නියමයන්ට පටහැනිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**5.11. කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) සැලසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව පිළියෙළ කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු නොකර ඇති අවස්ථා පහත දැක්වේ.

(i). දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවය වැඩි කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 281.35ක ප්‍රතිපාදන සහිත උප කාර්යයන් 12 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 277.15 ක්වූ කාර්යයන් 10 කින් කිසිදු භෞතික ප්‍රගතියක් ළඟා කරගෙන නොතිබුණද ඒ සඳහා රුපියල් මිලියන 13.38 ක් වැය කර තිබුණි.

(ii) උක්ත අරමුණ ඉටු කර ගැනීම සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීම වෙනුවෙන් උපකාර්යයන් 4 ක් යටතේ රු. මිලියන 7 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට පරිගණක සහ මෘදුකාංග මිලදී ගැනීමේ එක් උපකාර්යයක් පමණක් නිම කර තිබුණි. ඒ සඳහා සැලැසුම්ගත ප්‍රමාණය ඉක්මවා පරිගණක හා මෘදුකාංග 21 ක් මිලදී ගෙන තිබූ අතර, එහි මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 11.36 ක් වී තිබීමෙන් ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන 8.86 කින් වැඩි වී තිබුණි.

**5.12. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

බැංකු ගිණුමකට අදාල 2015 මාර්තු සිට ජුනි දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ 2015 ජුලි 30 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**(ආ) ගැලපුම් කළ යුතු ශේෂ**

**--------------------------**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 2015 මැයි මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳව විග්‍රහයට අනුව අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

**(i) හඳුනා නොගත් ලැබීම්**

**------------------------**

වර්ෂ 03 ඉක්මවූ එකතුව රු. 116,681 ක්වූ හඳුනා නොගත් ලැබීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. වර්ෂ 5 කට වැඩි කාලයක සිට අඛණ්ඩව බැංකු සැසඳුම් ප්‍රකාශවල ඇතුළත් කර තිබූ හඳුනා නොගත් ලැබීම් රු.101,288 ක් වී තිබුණි.

**(ii) නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්**

**------------------------------------------------------------------**

නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොවූ රු.573,320 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(iii) තැන්පත් කළ නමුත් ගිණුමට බැර නොවූ චෙක්පත්**

**---------------------------------------------------**

2008 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා අවස්ථා 08 කදී මුදලින් තැන්පත් කළ රු.781,659 ක් උපලබ්ධි වී නොතිබීම මත භේදයට තුඩුදෙන කරුණක් විය.

**(iv) හඳුනා නොගත් ගෙවීම්**

**-----------------------**

වර්ෂ 3 ඉක්මවූ රු.138,887 ක්වූ හඳුනා නොගත් ගෙවීම් හඳුනාගෙන ගිණුම්ගත කිරිමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

**5.13. අවිධිමත් ගනුදෙනු**

**-------------------**

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම**

**------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) IP Camera surveillance system ඒකක 30 ක් මිලදී ගැනීම සඳහා අදාල දෙපාර්තමේන්තු පිරිවිතරයන්ට සාරානුකූල ප්‍රතිචාර දක්වා තිබූ සහ රු.6, 933,920 ක් වු අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුව ප්‍රතික්ෂේප කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.6 මාර්ගෝපදේශයට පටහැනිව

කටයුතු කිරීම නිසා ලංසු වටිනාකම රු.10,744,669 ක් වූ කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට රු. ,810,745 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) cotton Rags කිලෝ ග්‍රෑම් 10,000 ක් රු.492,500 කට මිලදී ගැනීමේදී 2014 මැයි 29 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අභිබවා දෙපාර්තමේන්තුවේ ලියාපදංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයට ඇතුළත්ව නොතිබුණු සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා සැපයුම්කරු වෙත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4.3 (ඇ) මාර්ගෝපදේශයට පටහැනිව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

**5.14. මානව සම්පත් කළමනාකරණය**

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 09 | 28 | - |
| (ii) | ද්විතියික මට්ටම | 08 | 03 | 05 | - |
| (iii) | තෘතියික මට්ටම | 1,264 | 704 | 560 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 664 | 571 | 93 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් | - | 01 | - | 01 |
| | **එකතුව** | **1,973** | **1,288** | **686** | **01** |